කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2022 මාර්තු මස 21 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මාර්තු මස 20 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

බස්නාහිර, සබරගමුව සහ මධ්‍යම පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි වාර කිහිපයක් ඇතිවේ.

ඌව පළාතේත් මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවලත් පස්වරු 2.00න් පමණ පසුව ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

උතුරු, උතුරු-මැද සහ දකුණු පළාත්වල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී 40** පමණ දක්වා වැඩි විය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 21 MARCH 2022**
**Issued at 12.00 noon on 20 MARCH 2022**

Several spells of showers will occur in Western, Sabaragamuwa and Central provinces and in Galle and Matara districts.

Showers or thundershowers will occur at a few places in Uva province and in Batticaloa and Ampara districts after 2.00 p.m.

Wind speed can increase up to **40 kmph** at times in Northern, North-central and Southern provinces.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය**

# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 මාර්තු මස 20 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**ගිණිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපය මාර්තු 20 දින පෙ.ව. 5.30 වනවිට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ගිණිකොනදිග බෙංගාල බොක්ක සහ දකුණු අන්දමන් දූපත් මුහුදු ප්‍රදේශයට ආසන්නව උතුරු අක්ෂාංශ 9.8ත් නැගෙනහිර දේශාංශ 92.5ත් (9.8N 92.5E) ආශ්‍රිතව කේන්ද්‍රගතව පවතී. එම පද්ධතිය ආසන්නව උතුරු දෙසට ගමන් කරමින් තවදුරටත් වර්ධනය වී මාර්තු මස 21 උදැසන 5.30 පමණ වනවිට ගැඹුරු පීඩන අවපාතයක් සහ එදිනම සුළිකුණාටුවක් දක්වා වර්ධනය විය හැකියි.**

**නැවත දැනුම් දෙන තුරු උතුරු අක්ෂාංශ 06ත් 13ත් අතර සහ නැගෙනහිර දේශාංශ 89ත් 97ත් අතර මායිම්වන ගිණිකොනදිග සහ නැගෙනහිර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයට (06N-13N, 89E-97E) යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**මේ සම්බන්ධයෙන් නිකුත් කෙරෙන ඉදිරි අනාවැකි පිළිබඳ ව අවධානයෙන් සිටින ලෙස ධීවර හා නාවික ප්‍රජාවෙන් ඉල්ලා සිටිනු ලැබේ**

## වැසි තත්ත්වය:

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල වැසි වාර කිහිපයක් ඇතිවේ. මඩකලපුව සිට පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

## සුළඟ:

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශා වලින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (25-35) පමණ වේ. කන්කසන්තුරේ සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (45-55) පමණ දක්වා වැඩි විය හැක.

## මුහුදේ ස්වභාවය:

කන්කසන්තුරේ සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 20 MARCH 2022**

**The low-pressure area over Southeast Bay of Bengal has concentrated into a Depression and lay centered at 05.30 a.m. on 20th March over Southeast Bay of Bengal and adjoining south Andaman Sea near latitude 9.8N and Longitude 92.5E (9.8N 92.5E). It is likely to move nearly northwards and intensify into a Deep-depression by 21st March 05.30 a.m. and into a cyclonic storm on the same day.**

**Naval and fishing communities are advised not to venture into the East and southeast Bay of Bengal sea area bounded by (06N-13N and 89E-97E) until further notice.**

**Fishing and naval community are requested to be attentive future forecasts issued in this regard.**

**Condition of Rain:**

Several spells of showers will occur in the sea areas off the coast extending from Puttalam to Matara via Colombo and Galle. Showers or thundershowers may occur at a few places in the sea areas off the coast extending from Batticaloa to Hambantota via Pottuvil.

**Winds:**

Winds will be westerly to southwesterly and speed will be (25-35) kmph. Wind speed can increase up to (**45-55**) **kmph** at times in sea areas off the coast extending from Kankasanturai to Potuvil via Puttalam, Colombo, Galle and Hambantota.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Potuvil via Puttalam, Colombo, Galle and Hambantota will be rough at times. The other sea areas around the island can be moderate.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි